# පුංචි ඇජිට ඩෙංගු විජා



ඊසා උදම්ති හේරත්

# පුංචි අපිට ඩෙංගු එපා

ඊසා උදම්ති හේරත්

පුංචි අපිට ඩෙංගු එපා

© ඊසා උදම්ති හේරත්
මහාමායා බාලිකා විදුහල
4 ශ්‍රේණිය D
2025.02.08

ISBN 978 - 624 - 208 - 208 -726- 9

පිදුම

*මා හට අකුරු කියාදී යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන් පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

සඳුනි හරිම හොඳ ළමයෙක්.එයා හැම ක්‍රීඩාවකටම දක්ෂයි. ඒ වගේම ඉගෙනීමටත් දක්ෂයි.එයා හැමෝටම උදව් කරන කෙනෙක්. ඒක නිසා එයාට යාළුවොත් ගොඩක් ඉන්නවා. සඳුනිගේ හොඳම යාළුවෝ තමයි රාධා,ෆාරා,මල්කා සහ ලීලා



දවසක් සඳුනි ඉස්කෝලේ ගිහින් ආවට පස්සේ හොඳටම ඇඟ රත්වෙලා උණ ගත්තා.සඳුනිගේ අම්මා හොඳටම බය වුණා.සඳුනිට ඔළුව උස්සගෙන ඉන්න බැරි තරමට අමාරුයි. සඳුනිගේ අම්මා ඉක්මනින් වෛද්‍යවරයෙක් ළඟට ඇයව අරගෙන යනවා.



සඳුනිව පරීක්ෂා කළ වෛද්‍යවරයා තරමක් බැරෑරුම් මුහුණක් පෙන්වමින් පවසා සිටියේ සඳුනිගේ රුධිර පරීක්ෂාවක් කළ යුතු බවයි. ඒ අනුව වහාම සඳුනිගේ රුධිර පරීක්ෂාවක් කළ අතර එමගින් සඳුනිට ඩෙංගු රෝගය වැලදී ඇති බවට නිගමනය කෙරුණා.


වෛද්‍ය උපදෙස් මත සඳුනිව වහාම රෝහල් ගත කෙරුණා. වෛද්‍යවරයා පැවසු පරිදි සඳුනිගේ රුධිර පට්ටිකා මට්ටම ඉතා අඩු අගයකට පත් වී ඇති බැවින් සඳුනිට විවේකය අත්‍යාවශ්‍ය විය.



සඳුනිව රෝහල් ගත කළ බව දැනගත් ඇගේ යෙහෙලියන් ගොඩක් දුක් වුණා. එයාලා එදා හවසම සඳුනිව බලන්න රෝහලට ගියා. සේලයින් බෝතලයකුත් එල්ලලා. සඳුනි ඇදේ ඉන්න විදිහ දැක්කාම යාළුවන්ට ගොඩක් දුක හිතුනා.

සඳුනි, ඔයාට මොකද වුනේ?

මල්කා ඇහුවා



බලන්නකො දුවේ... සඳුනිට ඩෙංගු මදුරුවෙක් විදලා.

සඳුනිගේ අම්මා කිව්වා.

මේ සේලයින් කටුව ගහපු තැන ඔයාට ගොඩක් රිදෙනවාද?

ලලී හරිම දුකින් සඳුනිගේ අත අතගාන ගමන් ඇහුවා..

සඳුනි දුකෙන් බලාගෙන සිටියා.මිසක් කිසවක් පැවසුවේ නෑ.

දුව සඳුනිට කතා කරන්නවත් එපා කියලා තමයි දොස්තර මහත්තයා කිවේ.

ඩෙංගු හැදුන කෙනෙක් මහන්සි වුනොත් ඩෙංගු රක්තපාත තත්වෙට එන්න පුළුවන්ලු.

එහෙම වුනොත් තත්වය ටිකක් භයානකයිලු.

සදුනිගේ අම්මා ඇගේ යෙහෙලියන්ට ඩෙංගු රෝගයේ භයානකකම පැහැදිලි කරලා දුන්නා.

සඳුනිගේ මිතුරියෝ ටික හරිම දුකෙන් එයාගෙන් සමුඅරන් නිවෙස් කරා ගියා.



සඳුනිට මෙලෙස දින 5 ක් පමණ රෝහල් ගත වී ඉන්න සිදු වුණා.

මේ අතර සඳුනිගේ මිතුරියන් පාසැලේ විදුහල්පතිතුමියගේද අවසරය ඇතුව පාසල අවට පරිසරය පිරිසිදු කිරීමේ මහා ශ්‍රමදානයක් සුදානම් කළා.

මේ බලන්න ගාරා...

මේ පුංචි ටොෆි කොලයක රැදුන වතුර ටිකෙන් මදුරු පැටවු හැදිලා....


ලිලී කෑ ගසමින් දුවගෙන ආවා.

ඇත්ත තමයි...

මේවා අපේ නොසැලකිල්ල නිසා වෙන දේවල් නේ

මෙලෙස දින දෙකක් පුරා දෙමාපියන්, පාසල් සිසුන් මෙන්ම ගුරුවරුන්ගේද දායකත්වයෙන් මහා ශ්‍රමදානයක් සිදුකර පාසල් භූමිය හොඳින් පිරිසිදු කලා.

සඳුනිගේ යහළුවන්ට දැන් හරිම සතුටුයි.



අපි හැමෝගේම මහන්සිය නිසා අපේ පාසල ඩෙංගු මදුරුවන්ට බෝ වෙන්න බැරි තැනක් බවට පත් කළා. කියලා සඳුනිව බලන්න හතර වන දිනයේ රෝහලට ගිය මිතුරියන් සඳුනිට පවසා සිටියා.

සඳුනිටත් හරිම සතුටුයි.

ඇයටත් දැන් තරමක් සුව වී සිටි නිසා වෛද්‍ය උපදෙස් මත ඇයට නිවසට යාමට අවස්ථාවක් ලැබුණි.



පුංචි සඳුනි සනීප වෙලා..

එයා ගෙදර යනකොට අප්පච්චිත් තව කිහිප දෙනෙක් එක්ක එකතු වෙලා ගෙවත්ත සුද්දකරන්න පටන් අරගෙන...

පුංචි ටින් කැබලි , පොල් කටු වගේ අපි හිතන්නේ නැති තැන්වල ඇති පිරිසිදු වතුරෙලු මේ ඩෙංගු මදුරුවා බිත්තර දාන්නේ





සඳුනිටත් හරිම සතුටුයි.

අම්මෝ ... ඔයාලට නම් මට වගේ අසනීපයක් හැදෙන්න එපා. හරි අමාරුයි. මුළු ඇඟම රිදෙනවා.


පුංචි අපිට ඒ අමාරුව ඉවසන්න බැරි තරම්..

මීට පස්සේ නම් පරිසරයේ පිරිසිදු කම ගැන මීට වඩා උනන්දු වෙන්න ඕන. අද මට වෙච්ච දේ හෙට ඔයාලට වෙන්න පුළුවන්..

ඒ නිසා අපි හැමෝම එකතුවෙලා නිතරම පරිසරය පිරිසිදු කරමු.

පරිසරය පිරිසිදුව තබාගෙන





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්